Uva Wellassa University

# ප්‍රසම්පාදන දැන්වීම්
# දහතුන් වැනි උපාධි ප්‍රදානෝත්සවය
# ඡායාරූපගත කිරීම හා වීඩියෝ ආවරණය සඳහා මිල ගණන් කැඳවීම

යූඩබ්ලියු/එන්සීබී/ආර්/24/01

**නව ලොවින් දිනුම ලබන්න නව ලොවට සේවය කරන්න**

ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය සම්පත් ක්ෂේත්‍ර ඉලක්ක කොට ඊට වැඩි වටිනාකමක් ලබා දෙන නව ප්‍රවණතා නිර්මාණය කරයි. මෙම විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනික පාඨමාලා පළමු උපාධි, ආයතනික පුහුණු සහ වැඩිදුර අධ්‍යාපන ආදී ධාරා ඔස්සේ සේවායෝජකයන්ගේ නිෂ්පාදන වල අගයන් පුළුල් කරන කාර්යක්ෂම ශිෂ්‍ය පරපුරක් බිහි කරනු ඇත. ජාතික සංවර්ධනයට සහභාගී වන සාඩම්බර දායකයෙකු වීමට ඔබට කරන ඇරයුමයි.

2024/03/15 වන දින හම්බන්තොට මාගම් රුහුණුපුර ජාත්‍යන්තර සම්මේලන මධ්‍යස්ථානයේදී පැවැත්වීමට නියමිත ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයීය උපාධි ප්‍රදානෝත්සවය ඡායාරූපගත කිරීම හා වීඩියෝ ආවරණය සඳහා ජාතික විශ්වවිද්‍යාලයක උපාධි ප්‍රදානෝත්සවය ඡායාරූපගත කිරීම පිළිබඳ අවම වශයෙන් තුන් (3) වතාවක සතුටුදායක පළපුරුද්දක් ලබා ඇති ආයතන වලින් මිල ගණන් කැඳවනු ලැබේ .

මේ සඳහා ඉල්ලුම් කිරීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන් විසින් රු. 1000.00 ක මුදලක් මෙම විශ්වවිද්‍යාලයේ සරප් වෙත ගෙවා ලබාගත් රිසිට්පත හෝ ලංකා බැංකුවේ ගිණුම් අංක 3114820 වෙත ගෙවා ලබා ගත් රිසිට්පත සමග ලිඛිත ඉල්ලීමක් 2024/02/19 දින සිට 2024/03/04 වන දින ප.ව 3.00 දක්වා සහ, 2024 /03/05වන දින ප.ව 12.30 ට පෙර සතියේ දිනවල කාර්යාල වේලාව තුළදී **නියෝජ්‍ය මූල්‍යාධිකාරී (සැපයුම්)** වෙත ඉදිරිපත් කිරීමෙන් අදාල විස්තර සහිත ටෙන්ඩර්පතක් ලබාගත හැකිය. ටෙන්ඩර්පත් http://www.uwu.ac.lk/procurement/ යන විශ්වවිද්‍යාලයේ වෙබ් පිටුව මගින්ද ලබා ගත හැකිය. විශ්වවිද්‍යාලයේ වෙබ් පිටුව මගින් ටෙන්ඩර්පත් ලබාගන්නා ඉල්ලුම්කරුවන්, “ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය”නමින් නිකුත් කල රු. 1000.00 ක් වටිනා බැංකු ඇපකරයක් සමග හෝ විශ්වවිද්‍යාලයේ ගිණුම් අංක 3114820 ට ලැබෙන සේ මුදල් ගෙවා ලබා ගත් රිසිට්පත ටෙන්ඩර්පත් සමග අමුණා එවිය යුතුය. ටෙන්ඩර්පත් මිලදී ගැනීමට පෙර ඉල්ලුම්කරුවන් හට 2024/02/19 දින සිට 2024/03/04 දින දක්වා නොමිලයේ ටෙන්ඩර්පත් පරීක්ෂා කළ හැකිය.

සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත් 2024/03/05 වන දින ප.ව 2.30 ට පෙර **නියෝජ්‍ය මූල්‍යාධිකාරී (සැපයුම්), ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය, පස්සර පාර, බදුල්ල** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ලේඛකාධිකාරී කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීම කළ හැකිය. ටෙන්ඩර්පත් සහිත ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි **“උපාධි ප්‍රදානෝත්සවය ඡායාරූපගත කිරීම හා වීඩියෝ ආවරණය”** යනුවෙන් සඳහන් කළ යුතු අතර, ටෙන්ඩර්පත් එදිනට එම වෙලාවේදීම විවෘත කරනු ලැබේ.

වැඩි විස්තර නියෝජ්‍ය මූල්‍යාධිකාරී (සැපයුම්) 055-2226475 දුරකථන අංකයෙන් ලබා ගත හැක.

සභාපති
ප්‍රසම්පාදන කමිටුව
ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
බදුල්ල